# ශ්‍රී ලංකාවේ සසප සහ සසජාශි මැයි දිනය සමරයි

## Sri Lankan SEP and ISSE to hold May Day meeting

**2009 අප්‍රේල් 29**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) මැයි දිනය සැමරීමේ රැස්වීමක් කොළඹ දී පවත්වයි.

මෙම මැයි දිනය එළඹෙන්නේ, 1930 ගනන්වල මහා අවපාතයෙන් පසුව ලෝක ආර්ථිකය එහි ගැඹුරුතම අර්බුදයට මුහුන දෙන තතු තුල ය. ලෝකය පුරා දශලක්ෂ සංඛ්‍යාත රැකියා විනාශ කරනු ලැබ ඇත. ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයන් අසල්වැසියා හිඟමනට ඇද දැමීමේ පිලිවෙත්වලට හැරීගනිද්දී මිලිටරිවාදය සහ යුද්ධය තීව්‍ර කෙරෙයි.

මුලුමහත් දකුනු ආසියාව ම මෙම ලෝක අර්බුදයෙන් ඇලලී ඇත. ශ්‍රී ලංකාවේ දී මානව ඛේදවාචකයක් නිර්මානය කරමින්, ආන්ඩුව උතුරේ යුද්ධය උග්‍ර කර තිබේ. කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදීමට සහ වැඩ කරන ජනයා මත ආර්ථික අර්බුදයේ බර පැටවීම සඳහා යුද්ධය දේශපාලන අවියක් ලෙස යොදාගනු ලබයි.

ලෝකයේ කම්කරුවනි එක්වව්! යන මැයි දින පනිවිඩය ප්‍රායෝගික අවශ්‍යතාවක් බවට පත්ව ඇත. යුද්ධයේ, දරිද්‍රතාවයේ සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් අපයෝජනය කිරීමේ මූලය වන ලාභ පද්ධතිය අහෝසි කල හැක්කේ සමාජවාදී ඉදිරිදර්ශනය මත කම්කරු පන්තිය ඒකාබද්ධවීමෙන් පමනි. කම්කරුවන්ට තරුනයන් සහ බුද්ධිමතුන්ට රැස්වීමට සහභාගි වෙමින් සාකච්ඡාවට සම්බන්ධ වන ලෙස අපි ආරාධනය කරමු.

**දිනය සහ වේලාව:**

**මැයි 1 සවස 3ට.**

**ස්ථානය:**

**නව නගර ශාලාව,**

**ග්‍රීන්පාත්,**

**කොළඹ 7.**

**ප්‍රධාන කථිකයා:**

**සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්.**

© www.wsws.org